මහනුවර මහා නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය

------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන.

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජනවාරි 16 දින සභාවේ, නගරාධිපතිවරයා ඇතුළු නාගරික මන්ත්‍රීවරුන් වෙත යවා ඇත.

1.2 මතය.

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට මහනුවර මහා නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

--------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

---------------------

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කළයුතු රු.343,100 ක මුදලක්, තැන්පත් ගිණුමේ දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිග හිටි මුද්දර ගාස්තු ලෙස රු.27,176,619 ක් ගිණුම්ගත කර තිබුණ ද, 2014 වර්ෂයේ දි රු.60,192,216 ක මුද්දර ගාස්තු ආදායමක් ලැබී තිබීම හේතුවෙන්, රු.33,015,597 ක ඌන වෙන් කිරීමක් නිරීක්ෂණය විය.

(ඇ) 2013 වර්ෂය තුළ වැඩ අවසන් කළ හේවාහැට අතුරු පාර සංවර්ධනය කිරීමේ කර්මාන්තයට අදාළව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබියයුතු රු.89,758 ක මුදලක් ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) ලෝක උරුම නගර ව්‍යාපෘතියේ ස්ථාවර තැන්පතු වෙනුවෙන් වර්ෂය තුළ දි ලැබී තිබුණු රු.82,685 ක පොළී ආදායම්, ආදායම් ලෙස ගිණුම්ගත නොකර, 2014 අගෝස්තු දක්වාම බැංකු සැසඳුමේ වැඩි පුර බැර ලෙස දක්වා තිබුණි.

(ඉ) සභාව සතු ප්‍රධාන පුස්තකාලයේ හා ශාඛා පුස්තකාල 06 ක පවතින පොත්වල වටිනාකම් ගණනය කර, ස්ථාවර වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) වෙන්දේසි කරන ලද ලොරි රථයේ පිරිවැය හඳුනා ගෙන ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(උ) 2013 දෙසැම්බර් 29 වන දින විනාශ කරන ලද හා වෙන්දේසි කරන ලද වටිනාකම දක්වා නොතිබුණු වත්කම් අයිතම 14 ක් ගිණුම්වලින් ඉවත් කර නොතිබුණි.

**1.3.2 නොසැසඳු පාලන ගිණුම්.**

-----------------------

පාලන ගිණුම අනුව, සේවක ණය ශේෂය රු.152,764,208 ක් වූ අතර, උපලේඛන අනුව, ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.152,878,103 ක් වුයෙන්, රු.113,895 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.394,189,861 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.250,407,515 ක් විය. එම ශේෂයෙන් 2014 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අය වියයුතු ශේෂය රු.249,108,609 ක් විය.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.401,922,347 ක් වූ ගෙවියයුතු ගිණුම්ශේෂවල වටිනාකමින් රු.368,950,820 ක් වියදම් ණයහිමියෝ වූ අතර, එයින්, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.107,092,516 ක් විය. මෙම මුදලින් රු.54,538,146 ක් 2014 දෙසැම්බර් 31 වන විටත් ගෙවියයුතුව තිබුණි.**

**1.3.4 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.**

**-----------------------------------------------**

**පහත සදහන් නීති, රිති හා රෙගුලාසීවලට අනුකූල නොවූ අවස්ථා නිරික්ෂණය කරනු ලැබේ.**

| | නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | මහා නගර සභා ආඥා පනත **289(2)** වගන්තිය. | සාදන ලද කිසිම නියෝගයක් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබනතුරු සහ ඒ අනුමැතිය ගැසට් පත්‍රයේ පළ කරනු ලබනතුරු වලංගු නොවන බව සදහන්ව තිබිය දි, මධ්‍යම පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්ගේ අංක සීපීසී/සීඑම්එස්/**01/06/01/4-4** දරන ලිපියට අනුව, **2013** පෙබරවාරි **17** සිට **2013** දෙසැම්බර් **31** දක්වා කාලයට අදාළව සභා රැස්වීම් හා කමිටු දීමනා වශයෙන් රු.**964,500** ක් සභාවේ සභිකයින් වෙත ගෙවා තිබුණි. |
| (ආ) | <u>ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය</u> | |
| | (i) මු.රෙ. 396(ඩී) | බැංකු ගිණුම් 02 කට අදාළව එකතුව රු.158,186 ක් වටිනා නිකුත් කළ නමුත්, ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| | (ii) මු.රෙ. 756 හා 757 | i. 2013 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2014 නොවැම්බර් දක්වාම නිම කර නොතිබුණි.<br>ii. 2013 භාණ්ඩ සමීක්ෂණයේ දි සභාව සතු පුස්තකාල පොත් සමීක්ෂණයට ලක් කර නොතිබුණි. |

**2. මූල්‍ය සමාලෝචනය.**

**---------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**---------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.229,972,207 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.192,632,737 ක් වූයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.37,339,470 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**--------------------------------------**

**සමාලෝචිත වර්ෂයේ අතිරික්තය ඉකුත් වර්ෂයේ අතිරික්තය සමග සැසඳීමේ දී, රු.64,026,039 ක අඩුවීමක් නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා 2013 වර්ෂයේ දී උපකරණ හා ප්‍රාග්ධන වැය 2012 වර්ෂයට සාපේක්ෂව සියයට 112 ක වැඩිවීම මූලික වශයෙන් හේතු වී තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

**-----------------------------------**

**මුළු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 2.1 ක් විය. සමස්ත ජංගම වත්කම් වලින් සියයට 38 ක් හෙවත්, රුපියල් මිලියන 604 ක් ආදායම් ණයගැතියන් වූ අතර, මුදල් ශේෂය සියයට 12 ක් විය. මුළු ජංගම වගකීම් වලින් සියයට 48 ක් හෙවත්, රුපියල් මිලියන 215 ක් කර්මාන්ත හා විවිධ ණයහිමියන්ගෙන් සමන්විත වි තිබුණි.**

**2.4** ආදායම් පරිපාලනය.

--------------------

**2.4.1** ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

------------------------------------

ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 647,471 | 618,730 | 114,087 |
| (ii) බදු කුලී | 64,371 | 23,780 | 63,298 |
| (iii) බලපත්‍ර ගාස්තු | 31,257 | 32,062 | 220 |
| (iv) වෙනත් ආදායම් | 109,373 | 225,473 | 396,644 |

**2.4.2** සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

---------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ජනරජයේ අංක 1597/8 හා 2009 අප්‍රේල් 17 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය ප්‍රකාරව 2012 මාර්තු 09 දින වන විටත් සංවර්ධන බලපත්‍ර ලබා නොගෙන අනවසරයෙන් ඉදි කර තිබූ සම්ප්‍රේෂණ කුළුණු 53 ක් සඳහා අනවසර ගාස්තු ලබා ගෙන නීත්‍යානුකූල නොකිරීම හේතුවෙන්, සභාවට රු.1,180,000 කට වැඩි මුදලක් අහිමි වී තිබුණි.

(ii) මධ්‍යම පළාත් සභාවේ, පළාත් පාලන කොමසාරිස්ගේ **2014** ජූනි **18** දිනැති අංක **2014/04** දරන චක්‍රලේඛය ප්‍රකාරව සම්ප්‍රේෂණ කුළුණු ස්ථානගත කර ඇති වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන දිනට ව්‍යාපාර බදු අය නොකිරීම හේතුවෙන්, සභාවට දළ වශයෙන් රු.**5,000,000** කට වැඩි මුදලක් අහිමි වී තිබුණි.

(iii) ශ්‍රී ලංකා ජනරජයේ **2012** නොවැම්බර් **16** දිනැති අංක **1785** දරන ගැසට් නිවේදනය ප්‍රකාරව, සම්ප්‍රේෂණ කුළුණු මගින් ව්‍යාපාර බදු අය කිරීමට අදාළ නියෝගයන් ගැසට් මගින් ප්‍රකාශයට පත් කළයුතු වුවත්, එසේ කර නොතිබුණි.

(iv) **2010** නොවැම්බර් **26** දිනැති අංක **1682, 2011** නොවැම්බර් **04** දිනැති අංක **1731** හා **2012** නොවැම්බර් **16** දිනැති අංක **1785** දරන ගැසට් නිවේදන වලට අනුව, දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා ඉඩකඩ සපයා දීමට අදාළව ගැසට් මගින් ප්‍රකාශයට පත් කර තිබූ ගාස්තු අය නොකිරීම හේතුවෙන්, ඉකුත් වර්ෂ **03** ට අදාළව රු.**960,000** කට වැඩි මුදලක් සභාවට අහිමි වී තිබුණි.

**2.4.3** පරිසර බලපත්‍ර ගාස්තු

-----------------------

**1988** අංක **56** හා **2000** අංක **53** හා දරන පනත්වලින් සංශෝධිත **1980** අංක **47** දරන පාරිසරික පනත හා ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව **2008** ජනවාරි **25** දිනැති අංක **1533/16** දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ ව්‍යාපාර ආයතන **193** ක් සඳහා ව්‍යාපාර බලපත්‍ර නිකුත් නොකිරීම හේතුවෙන්, රු.**1,428,200** ක මුදලක් සභාවට අහිමි වී තිබුණි.

**2.4.4** දැන්වීම් පුවරු ගාස්තු

-------------------------

**2012** නොවැම්බර් **16** දිනැති අංක **1785** දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව, සභා බල ප්‍රදේශයේ ප්‍රදර්ශනය කර තිබුණු දැන්වීම් පුවරු **181** කින් රු.**1,748,683** ක ගාස්තු අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය.

---------------------------

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා.

----------------------------------

සභාව සතු රු.**41,443,200** ක් වටිනා ඉඩම් හා ගොඩනැගිලි ඒකක **105** ක් සහ එකතුව රු.**325,920,737** ක් වටිනා ලී බඩු හා සවි කිරීම්, යන්ත්‍ර හා උපකරණ, මෝටර් රථ හා කරත්ත පිළිබඳව උපලේඛණ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා.

---------------------------

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට ශේෂ පත්‍රයේ පෙර ගෙවුම් යටතේ දක්වා තිබුණු රු.**7,946,021** ක දේපළ ණය පොළී වසර **02** ක කාලයක සිට ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) **2004** සිට **2012** දක්වා කාල පරිච්ඡේදය තුළ මිය ගිය හා විශ්‍රාම ගිය සේවකයින් **07** දෙනෙකුගෙන් අය වියයුතු රු.**266,795** ක ණය ශේෂයක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) **2012** වර්ෂයට පෙර සේවය අත හැර ගිය සේවකයින් තුන් දෙනෙකුගෙන් හා වැඩ තහනම් කළ සේවකයින් **08** දෙනෙකුගෙන් පිළිවෙළින් අය වියයුතු රු.**9,500** ක් හා රු.**535,311** ක ණය මුදල් සාමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රු.**160,696** ක් වටිනා අගරු චෙක්පත් **12** ක් වසර **02 - 05** දක්වා කාලයක සිට අය කර ගැනීමට හෝ සුදුස්සක් කිරීමට කටයුතු කිරීමකින් තොරව ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ඉ) බැංකු ගිණුම් **02** කට අදාළව අවස්ථා **103** කදී, බැංකුවට සෘජුව ලැබී තිබුණු රු.**6,316,390** ක් හා නිත්‍ය නියෝග මත අවස්ථා **12** කදී, ගෙවන ලද රු.**56,331** ක් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු නොකර, **2014** මැයි මාසය දක්වා බැංකු සැසඳුමේ දක්වා තිබුණි.

(ඊ) බැංකු ගිණුම් **02** ක බැංකුගත කළත්, උපලබ්ධි වී නොතිබුණු රු.**3,256,190** ක් වටිනා ණයපත් ලැබීම් සහ චෙක්පත් හා මුදල් අඩුවෙන් තැන්පත් කිරිමේ අවස්ථා **116** ක් සම්බන්ධයෙන් හේතු සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.** පද්ධති හා පාලන

-------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඉ) ණයගැති හා ණයහිමි පාලනය